සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ ("බැංකුව") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරුවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

කරුණක් අවධාරණය කිරීම

බැංකුවේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල යෝජිත වෙනස පිළිබඳව විස්තර කරන මූල්‍ය ප්‍රකාශන වල සටහන අංක 2.7.ii වෙත මා අවධානය යොමු කරමි. මෙම කාරණය සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලබයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය .

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, හා ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛන්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල "ප්‍රමුඛ ඉතුරුම් සංවර්ධන බැංකුවේ (PSDB) අනෙකුත් වගකීම්" යටතේ රු.21,438,407 ක හඳුනා නොගත් ආන්තික ගිණුම් ණය ශේෂයක් වාර්තා කර තිබුණි. මෙම ශේෂය වසර දහයකට වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශන වල නිරවුල් කර නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට රු. 21,438,407 ක ආන්තික ගිණුමේ ශේෂයෙන් රු.5,653,986.27 ක් ණය ගැණුම්කරුවන් විසින් කරන ලද ගෙවීම් වේ. අදාළ ණය ගැණුම්කරුවන් ප්‍රමුඛ ඉතුරුම් සංවර්ධන බැංකුව (PSDB) සම්බන්ධයෙන් වගකීම් සම්පූර්ණයෙන්ම පියවා ඇත. විස්තර පහත දැක්වේ.	දිගු කාලීන හිඟ ශේෂ සාධාරණ කාලයක් තුළ පියවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.

ණය අංකය	නම	වටිනාකම (රු.)
	වොන්ඩර්ලයිට් කස්ට(ර්)මස්	924,586.63
	සී.ඩී.කේ.ලොකුගේ	8,299.64
91	ද කෲස් කුමාර	500,000.
22	ඒ.අමරකෝන්	100.
568	සාලිය පොටෝ	1,000.

	වණික් කෝපරේෂන් පුත්තලම් කෘෂිකර්මය	2,500,000.
706 & 715	ඩී.ඩබ්.විජේසිංහ	70,000
360	ලක්ෂාමා	1,650,000
		5,653,986. 27

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
		ඉහත එක් එක් ශේෂයන් ආන්තික ගිණුමෙන් ඉවත් කිරීම සඳහා ගිණුම්කරණ ගැළපුම් යෙදීමට පියවර ගනු ලැබේ. ● ණය අංක 510 T. G. N පොන්නයියා ප්‍රතිලේඛනගත කරන ලද ණය සඳහා රු.19,200 අත්තිකාරකමක් ගෙවා ඇති අතර, අනාගත වාරික සඳහා අඩු කිරීමට එම මුදල ආන්තික ගිණුමේ රඳවා ඇත. ●ඉතිරි ශේෂයන්, පවතින නඩු කටයුතු වලට සම්බන්ධ හෝ පවතින ණය ශේෂයට එරෙහිව හිලව් කිරීමට සහ එක් එක් ණයෙහි ශේෂයන් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිත වේ.	
(ii)	මූල්‍ය ප්‍රකාශන වල "වෙනත් වගකීම්" ශේෂය තුළ හඳුනා නොගත් බැංකු තැන්පතු වලින් සමන්විත රු.5,344,465 ක හඳුනා නොගත් අවිනිශ්චිත ගිණුම් ශේෂයක් ඇතුළත් වේ.	මෙම තැන්පතු ගණුදෙනුකරුවන් හඳුනා ගැනීම සඳහා කිසිදු ප්‍රකාශයක් නොමැතිව ගණුදෙනුකරුවන් විසින් ඍජුවම සිදු කර ඇත. එබැවින් ඒවා අවිනිශ්චිත ගිණුමට මාරු කර ඇත. බැංකුව ඔවුන් හඳුනා ගැනීමට සෑම උත්සාහයක්ම ගෙන ඇති අතර ඔවුන් හඳුනා ගැනීම සඳහා වරින් වර පසුවිපරම් කර ඇත. තවද, 2024 වර්ෂයේ සහ 2025 අගෝස්තු මාසය දක්වා මේ සඳහා කිසිදු මුදලක් එකතු වී නොතිබුණි.	සාධාරණ කාලරාමුවක් තුළ මෙම ශේෂයන් හඳුනාගෙන විසඳීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

1.5.2 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් 2024 ජනවාරි 11 දිනැති අංක 02/19/319/0001/005 දරන ලිපිය මගින් 2024 මාර්තු 31 වන දින වන විට ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන ලෙස බැංකුවට උපදෙස් දී	බැංකුව විසින් බැංකුවේ වත්කම් වලින් 74% ක් මාරු කර ඇත. සමහර දේපළවල හිමිකම්වල අඩුපාඩු ඇති බව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ නීති දෙපාර්තමේන්තුව පෙන්වා දී ඇති බැවින්, බැංකුව මේ සම්බන්ධයෙන් ගරු නීතිපති දෙපාර්තමේන්තුවෙන් මතයක් ඉල්ලා	පවතින සම්පත් නිෂ්කාර්යව පැවතීම වැළැක්වීම සඳහා ඒකාබද්ධකිරීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය.

තිබුණි. පසුව මෙම අවසාන දිනය 2025 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, 2025 ජුලි 15 වන දින වන විටත් බැංකුව ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර නොතිබූ අතර 2025 දෙසැම්බර් 31 දක්වා තවදුරටත් දීර්ඝ කිරීමක් ලබාගෙන තිබුණි.	ඇත. 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ අධිකරණ නියෝගයක් ලබා ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව ඉල්ලා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය 2025 දෙසැම්බර් 31 දින දක්වා කාලය දීර්ඝ කරන ලෙස මහ බැංකුවෙන් ඉල්ලා ඇති අතර මහ බැංකුව මේ සඳහා අනුමැතිය ලබා දී ඇත.	

1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවෙන් පවරා ඇති පහත දැක්වෙන වත්කම් සත්‍යාපනය කිරීමට සාක්ෂි කිසිවක් නිරීක්ෂණය නොවුණි. අයිතමය | වටිනාකම (රු.) ---------- | -------------- කලින් ගෙවූ වට්ටම් | 13,356,809 ප්‍රමුඛ ඉතුරුම් සහ සංවර්ධන බැංකුවේ (PSDB) නීති කටයුතු වෙනුවෙන් වූ තැන්පතු අරමුදල | 7,098,200	1.ප්‍රමුඛ ඉතුරුම් සහ සංවර්ධන බැංකුව (PSDB) පවරා ගන්නා විට කලින් ගෙවූ වට්ටම් ශේෂය මාරු කර ඇත. එබැවින්, සත්‍යාපනය සඳහා සාක්ෂි නොමැත. 2. ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) සේවකයින්ගේ පාරිතෝෂික ගෙවීම් පිළිබඳ ගැටළුවක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියාචනා නඩු දෙකක් විභාග වෙමින් පවතින අතර එහි සම්පූර්ණ වටිනාකම රු7,098,200. කි. එම නඩු වන්නේ • SC/HC/LA/01/2017 • SC/HC/LA/02/2017	ගිණුම්වල ඉදිරිපත් කර ඇති සියළුම ශේෂයන් සඳහා ප්‍රමාණවත් උපකාරක ලියවිලි සහ සවිස්තරාත්මක විස්තර පවත්වා ගත යුතුය.

1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
පහත දක්වා ඇති ලැබිය යුතු ශේෂ වර්ෂ කිහිපයක සිට අයකර ගැනීමකින් තොරව හිඟව පැවතුණි. **විෂයය** | **වටිනාකම (රු.)** -------- | -------------- ලැබිය යුතු මුද්දර ගාස්තු | 1,999,000 පසුදාතම් චෙක්පත් වට්ටම් ගිණුම | 349,419	**ලැබිය යුතු මුද්දර ගාස්තු -** වටිනාකම යනු ණය පැහැර හරින ලද පාරිභෝගියකුගේ උකස් කළ දේපළක් බැංකුවට ලබා ගැනීමේදී කරන ලද ගෙවීමකි. මෙම වටිනාකම ආපසු අයකර ගත හැකි වන්නේ දේපළ අපහරණය කළ විට පමණි. **පසු දාතම් චෙක්පත් වට්ටම් ගිණුම:** ශේෂය අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.	දිගුකාලීන හිඟ ශේෂයන් අයකර ගැනීමට කාලෝචිත හා යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.6.2 ගෙවියයුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
"ගෙවිය යුතු වෙනත් ණය හිමියන්" යටතේ හෙළිදරව් කරන ලද ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) රු.31,707,499 ක ණය වටිනාකමක් වසර තුනකට වඩා වැඩි කාලයක් පැවතුණි.	ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB)– ණයගැණුම්කරුවන් - මේවා ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) පාරිභෝගිකයින් විසින් නොපියවූ ශේෂයන් වේ. එබැවින්,මෙම ශේෂයන් ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) ණය ගිණුමේ ඇත. සෑම මාස හයකට වරක්, අපි විසින් ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) වගකීම් වල ශේෂයන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කරන්නෙමු.	බැංකුව මෙම ශේෂ වල වත්මන් තත්ත්වය සත්‍යාපනය කර එම ශේෂයන් පියවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24-සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම් හි 09 (b)(i) ඡේදය අනුව සෑම මව් ආයතනයක්, පරිපාලිත ආයතනයක් සහ ආශ්‍රිත පරිපාලිතයන් සම්බන්ධිත පාර්ශවයන් ලෙස සලකනු ලැබේ, ජාතික ඉතිරිකිරීම් බැංකු අරමුදල් කළමනාකරණ සමාගම (NSBFMC) සහ බැංකුව (වාර්තාකරණ ආයතනය) එකම කණ්ඩායමකට අයත් වුවද, බැංකුව ජාතික ඉතිරිකිරීම් බැංකු අරමුදල් කළමනාකරණ සමාගම (NSBFMC) සම්බන්ධිත පාර්ශවයක් ලෙස හඳුනාගෙන නොමැති අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශන වල ජාතික ඉතිරිකිරීම් බැංකු අරමුදල් කළමනාකරණ සමාගම (NSBFMC) සමඟ සිදුකරන ලද ගනුදෙනු හෙළිදරව් කර නොතිබුණි.	බැංකුව ප්‍රාථමික අලෙවිකරු වන ජාතික ඉතිරිකිරීම් බැංකු අරමුදල් කළමනාකරණ සමාගම (NSBFMC) හරහා රජයේ සුරැකුම්පත්(භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර) වල ආයෝජන සිදු කර ඇත. ජාතික ඉතිරිකිරීම් බැංකු අරමුදල් කළමනාකරණ සමාගම (NSBFMC) සමඟ සෘජු ආයෝජනයන් සිදු කර නොමැත. කෙසේ වෙතත් 2025 වර්ෂයේ දී අනාවරණය කරනු ඇත.	බැංකුව විසින් අදාළ සියළු සම්බන්ධිත පාර්ශවයන් හඳුනාගෙන, අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන වල සිදු කළ බවට තහවුරු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 416,393.464 ක ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූප ලාභය රු.758,720,218 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.342,326,754 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වසරට සාපේක්ෂව පොළී ආදායම සහ ශුද්ධ අනෙකුත් මෙහෙයුම් ආදායම පිළිවෙලින් රු.148,277,050 කින් සහ රු. 219,396,731 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

2.2 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා බැංකුවේ ඇතැම් වැදගත් අනුපාත පෙර වසර සඳහා වූ ආංශික අනුපාතයන් සමඟ සැසඳීම පහත දැක්වේ.

විස්තරය	අංශය		සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව (SLSBL)	
	2024	**2023**	**2024**	**2023**
ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය (ROE) (%)	14	8.4	5	9.91
වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (ROA) (%)	2	0.5	6	8.45
ශුද්ධ පොළී ආන්තිකය (%)	5	2.70	16	18.88
ද්‍රවශීල වත්කම් අනුපාත	N/A	51.5	N/A	1289
ප්‍රාග්ධන අනුපාතය-ස්ථර 1 (අවම අවශ්‍යතාව 8.5%)	14.9	15.2	171	163
මුළු ප්‍රාග්ධන අනුපාතය-ස්ථර 1 (අවම අවශ්‍යතාව 8.5%)	18.4	18.4	171	164
පියවර 3 ණය- මුළු ණය සහ අත්තිකාරකම්වලින්	12.3	10.7	49	44

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) 2021 ජනවාරි 05 දින මෙහෙයුම් අත්හිටුවීමෙන් පසු බැංකුවේ ණය අයකර ගැනීමේ ප්‍රගතිය බොහෝ ණය කාණ්ඩ සඳහා සතුටුදායක වුවද, SLS දිරිය ණය යෝජනා ක්‍රමයේ අක්‍රීය ණය ප්‍රමාණයේ සැලකිය යුතු වර්ධනයක් 2025 අප්‍රේල් 30 දිනට නිරීක්ෂණය වුණි. මුළු අක්‍රීය ණය මුදල 2021 ජනවාරි 01 දින 25,666,399 සිට 2025	2025 අප්‍රේල් 30 දිනට "SLS දිරිය" ණය යෝජනා ක්‍රමයේ මුළු අක්‍රීය ණය ප්‍රමාණය රු.මිලියන 112 කි. එයින් රු.මිලියන 77.5 ක් ප්‍රධාන ණය පහසුකම් තුනකින් සමන්විත වේ. එක් පහසුකමක් භාණ්ඩාගාර ඇපකරයකින් සුරක්ෂිත කර ඇති අතර අනෙක් පහසුකම දේපළ උකස් කිරීමෙන් සුරක්ෂිත කර ඇත. 1.නෝර්ත්සී සමාගම - රු.මිලියන 52.3	SLS දිරිය ණය යෝජනා ක්‍රමයේ අක්‍රීය ණය අයකර ගැනීම සඳහා සතුටුදායක ක්‍රියාමාර්ග ගත යුතුය.

අප්‍රේල් 30 දින වන විට රු.112,002,428ක් දක්වා වර්ධනය වී තිබුණි.	නෝර්ත්සී ලිමිටඩ් යනු රජය සතු සමාගමකි.මෙම පහසුකම රුපියල් මිලියන 60 ක භාණ්ඩාගාර ඇපකරයක් මඟින් සුරක්ෂිත කර ඇත.අප විසින් භාණ්ඩාගාර ඇපකර හිමිකම් පෑමක් භාණ්ඩාගාරයෙන් ඉල්ලා සිටි නමුත් තවමත් භාණ්ඩාගාරයෙන් ප්‍රතිචාරයක් ලැබී නොමැත. සමාගම වර්තමානය වන විට මාසිකව රු.300,000 ක් වාරිකයෙන් කොටසක් ලෙස ගෙවමින් සිටී. 2.ගුරුගේ මහතාගේ උකස් කරන ලද දේපළ "පරාටේ වෙන්දේසිය" යටතේ වෙන්දේසි කිරීමට බැංකුව අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් සම්මත කර ගෙන තිබුණි. කෙසේ වෙතත්, ඩී.එම්.ගුරුගේ මයා සහ ඩී.එස්. ගුරුගේ මයා වෙන්දේසිය වළක්වාලමින් වාරණ නියෝගයක් ලබාගෙන ඇත. වහාම අයකර ගැනීමක් අපේක්ෂා කළ නොහැක. නිශ්චල දේපළ ඇපයට තබා මෙම පහසුකම ලබා දී ඇත. 3. පී.එල්.එස්.ආර් කුමාර මයා -2023.01.27 දින පරාටේ ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් සම්මත කර ඇත. ඉන්පසු ණය ගැණුම්කරු 2023 ජනවාරි මාසයේ සිට නිතිපතා මාසික ගෙවීම් ආරම්භ කර ඇති අතර මසකට රු. මිලියන 1 ක් ගෙවිය හැකි බැවින් ණය මුදල ප්‍රතිලේඛණගත කරන ලෙස බැංකුවට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, රුපියල් මිලියන 13.8 ක සමුච්චිත හිග මුදල් සඳහා 2024 මාර්තු මාසයේ නව ණයක් විවෘත කිරීමෙන් මෙම ණය මුදල ප්‍රතිලේඛණගත කරන ලදී. කෙසේ වෙතත්, ණය ගැණුම්කරු දැනට පහසුකම් දෙකටම මාසිකව ගෙවීම් සිදු කරයි. පහසුකම ප්‍රතිලේඛණගත කිරීමෙන් පසු, 2025.04.30 දින දක්වා ඔහු රුපියල් මිලියන 9.7 ක් තැන්පත් කර ඇත.

(ii)	2025 අප්‍රේල් 30 දිනට SLS දිරිය ණය 29 ක සමස්ථ මුළු හිඟ ශේෂය රු.166,041,462 ක් වුණි. එයින් ණය ශේෂ 17 ක රු.112,002,428 ක් අක්‍රිය ණය කාණ්ඩයේ වුණි. මෙම ණය කාණ්ඩය සඳහා ගණනය කරන ලද අක්‍රීය ණය අනුපාතය සියයට 67 ක් වූ අතර එය ඉතා ඉහළ අනුපාතයකි.	ප්‍රධාන අක්‍රීය ණයවල අයකර ගැනීමේ තත්ත්වය.			SLS දිරිය ණය යෝජනා ක්‍රමයේ අක්‍රීය ණය අයකර ගැනීම සඳහා සතුටුදායක ක්‍රියාමාර්ග ගත යුතුය.
		ණය ගැණුම්කරුගේ නම	**2025.04.30 දිනට හිඟ ප්‍රාග්ධන මුදල (රු.)**	**අයකර ගැනීම් වල වර්තමාන තත්ත්වය**	
		පී.එල්.එස්. ආර් කුමාර මයා	මිලියන 9.9	2023.01.27 දින පරාටේ ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් සම්මත කර ඇත. ඉන්පසු ණය ගැණුම්කරු 2023 ජනවාරි මාසයේ සිට නිතිපතා මාසික ගෙවීම් ආරම්භ කර ඇති අතර මසකට රු. මිලියන 1 ක් ගෙවිය හැකි බැවින් ණය මුදල ප්‍රතිලේඛණගත කරන ලෙස බැංකුවට ඉල්ලීමක්ඉදිරිපත් කර ඇත. ඒ අනුව, රුපියල් මිලියන 13.8 ක සමුච්චිත හිග මුදල් සඳහා 2024 මාර්තු මාසයේ නව ණයක් විවෘත කිරීමෙන් මෙම ණය ප්‍රතිලේඛණගත කරන ලදී. කෙසේ වෙතත්,	

		ණය ගැණුම්කරු දැනට පහසුකම් දෙකටම මාසිකව ගෙවීම් සිදු කරයි. පහසුකම ප්‍රතිලේඛණගත කිරීමෙන් පසු,2025.04.30 දින දක්වා ඔහු රුපියල් මිලියන 9.7 ක් තැන්පත් කර ඇත.
නෝර්ත්සී ලිමිටඩ්	මිලියන 52.3	මෙම පහසුකම රජය සතු සමාගමකට රුපියල් මිලියන 60 ක භාණ්ඩාගාර ඇපකරයක් මත ලබා දී ඇත. සමාගම දැනට ඌණ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින අතර ද්‍රවශීලතා අර්බුදයකට මුහුණ දී සිටින බැවින්, 2022.06.02 දිනැති අපගේ ලිපිය මගින් භාණ්ඩාගාරයෙන් භාණ්ඩාගාර ඇපකර හිමිකම් පෑම ඉල්ලා සිටින ලදී. සිහිකැඳවීම් කිහිපයක් යවා ඇති අතර භාණ්ඩාගාරය සමඟ රැස්වීම් කිහිපයක් ද පවත්වා ඇත. අපගේ අඛණ්ඩ පසු විපරම්වල

		ප්‍රතිඵලයක් ලෙස, 2023 අගෝස්තු මාසයේ සිට රුපියල් 100,000 සිට ගෙවීම් ආරම්භ කිරීමට නෝර්ත්සී සමාගම එකඟ වී ඇති අතර වර්තමානයේ එය රුපියල් 300,000 දක්වා වර්ධනය වී ඇත.ඔවුන් මෙම මුදල සඳහා බාහිර මූලාශ්‍ර වලින් ජනිත කරන්නාවූ නිෂ්පාදනයෙන් උපයන සීමිත මුදල අප වෙනුවෙන් වෙන්කර ඇත.
ඩී.එම්.ගුරු ගේ මයා සහ ඩී.එස්. ගුරුගේ මයා	මිලියන 25.2	සියළු නියාමන අවශ්‍යතා සපුරාලමින් පාරාටේ වෙන්දේසිය 2023.07.04 දින පැවැත්වීමට නියමිත වී තිබුණි. කෙසේවෙතත්, ණය ගැණුම්කරු 2023.06.28 දින කොළඹ දිස්ත්‍රික් අධිකරණයෙන් වාරණ නියෝගයක් ලබාගෙන ඇති බැවින් වෙන්දේසිය පැවැත්වීමට

		නොහැකි විය. අධිකරණ නඩුව තවමත් විභාග වෙමින් පවතී.
ඩී.එම්. රංජිත් මයා ඩී.පී. වනසිංහ මිය	මිලියන 2.3	නඩු විභාග යටතේ පවතී.
එකතුව	**මිලියන 89.7**	

(iii)	ක්ෂුද්‍ර මූල්‍ය ණය වල සමස්ත හිඟ ශේෂය 2025 අප්‍රේල් 30 දිනට රු.233,391,715 ක් වූ අතර මුළු මුදලම අක්‍රීය කාණ්ඩය යටතේ වර්ගීකරණය කර තිබුණි.	සමහර ණය ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSBL) සමඟ ඒකාබද්ධ වීමට පෙර ජාතික සංවර්ධන භාර අරමුදල (NDTF) විසින් මූලිකව ලබා දී තිබුණි. මෙම ණය මූලික වශයෙන් අඩු ආදායම්ලාභීන් සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන ඇත. 2021 ජනවාරි 5 දිනැති ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝගයකට අනුව ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSBL) හට එහි ක්‍රියාකාරීත්වය අත්හිටුවන ලෙස උපදෙස් දෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුව විසින් හිඟ ණය ආපසු අයකර ගැනීමේ අභියෝග ඇති කළ හවුල්කාර සංවිධාන වලට ණය ලබා දීම නවතා දමන ලදී. අත්හිටුවන විට ක්ෂුද්‍ර මූල්‍ය ණය වල මුළු හිඟ ශේෂය රුපියල් මිලියන 806.6 ක් වුණි. මෙම අක්‍රීය ණය සමඟ සම්බන්ධ බොහෝ හවුල්කාර සංවිධාන වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති අතර, අයකර ගැනීමේ උත්සහයන් අඛණ්ඩව සිදුවෙමින් පවතින බව සඳහන් කිරීම වැදගත්ය.	හිඟ මුදල් නියමිත කාලයට එකතු කිරීම සහතික කිරීම සඳහා බැංකුවේ ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් සහ වේගවත් කළ යුතුය.

3.2 නිශ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
බැංකුව සතුව ධාවනය තත්ත්වයේ නොමැති වාහන දෙකක් (වාහන අංක.65-2021 සහ 59-1697) ඇති අකර මෙම වාහන වල හිමිකම බැංකුව වෙත පවරා ගෙන නොතිබුණි.	• 2002 වසරට පෙර ණයදෙනුකරුවකු විසින් වාහන අංක 65- 2021 දරන වාහනය ප්‍රමුඛ ඉතුරුම් සහ සංවර්ධන බැංකුවට (PSDB) භාර දී ඇති අතර ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් 2007 දී ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSBL) වෙත පවරා ඇත. මෙම වාහනය බදු සහනය යටතේ අලුතින් ආනයනය කර ඇති අතර ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව විසින් ආදායම් බලපත්‍රය ලබා ගැනීමට උත්සහ කලද මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව (RMV) විසින් වාහනය ධාවනය කිරීමට බලපත්‍රය නිකුත් කර නොමැති අතර නියමිත බදු ගෙවන ලෙස බැංකුවට උපදෙස් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, බැංකුව මහත් පරිශ්‍රමයක් දරා ආදායම් බලපත්‍රය ලබා ගැනීමෙන් පසු 2019 දක්වා මෙම වාහනය භාවිතා කර ඇත. ගෙවිය යුතු බදු මුදල පිළිබඳව දැනුවත් නොකළද, නියමිත බදු මුදල වාහනයේ වත්මන් වෙළඳපල වටිනාකමට වඩා වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවදුරටත් වාහනයේ ධාවන තත්ත්වය ලබා ගැනීම සඳහා විශාල තාක්ෂණික අලුත්වැඩියාවක් සිදු කිරීමට ඇත. • අංක 59-1697 දරන වාහනය සඳහා ලියාපදිංචි සහතිකය 2025 අගෝස්තු 20 වන දින ලබා ගන්නා ලදී.	මෙම වාහනවල අයිතිය බැංකුවට පවරා ගැනීම සහතික කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.